(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 154.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජුනි 10 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

26/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අතරමගදී පාසල් හැර ගිය ළමුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ළමුන් අයත් වන වයස් කාණ්ඩ කවරේද;

(iii) එම ළමුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ළමුන් පාසල් හැරයාමට බලපා ඇති පොදු හේතු කවරේද;

(v) ඒ සඳහා රජය මඟින් ලබා දෙනු ලබන විසඳුම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගැටලුව සම්බන්ධයෙන් රජය විසින් විධිමත් අධ්‍යයනයක් සිදුකරනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් කඩිනමින් සිදු කළ යුතු බව පිළිගන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1976/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආබාධ සහිත තැනැත්තන් සඳහා ලබාදෙන මාසික ජීවනාධාර මුදල කොපමණද;

(ii) මාසිකව ආබාධිත දීමනාව ලබන ආබාධිත තැනැත්තන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දීමනාව සඳහා අලුතින් ඉල්ලුම් කළ හැකි ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) පවුලක ආබාධ සහිත පුද්ගලයන් කිහිපදෙනෙක් සිටින විට, ඉන් ජීවනාධාරය ලබාගැනීමේ හැකියාව ඇති පුද්ගලයන් ගණන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාසික ජීවනාධාර ලබාදීමේදී සුදුස්සන් තෝරා ගැනීම සඳහා භාවිතා කරනු ලබන නිර්ණායක කවරේද;

(ii) ඒ සඳහා අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් මට්ටම නිශ්චය කරන ක්‍රමවේදය කවරේද;

(iii) අස්වැසුම හෝ වෙනත් ජීවනාධාරයක් ලබන ආබාධ සහිත තැනැත්තෙකුට ආබාධිත දීමනාව ලබා ගැනීමට බාධාවක් තිබේද;

(iv) 2026 අයවැය මඟින් ආබාධිත දීමනාව ගෙවීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(v) ආබාධිත දීමනාව අපේක්ෂිත පුද්ගලයන් පොරොත්තු ලේඛනයක රැඳී සිටීමට සිදුවන්නේද;

(vi) මාසයේ නිශ්චිත දිනයක දිවයින පුරා ආබාධිත දීමනාව ගෙවීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කිරීමේ හැකියාව තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1989/2026

ගරු චන්දන තෙන්නකෝන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වන අලි ගහනය කොපමණද;

(ii) අවසන් වරට සිදු කළ වන අලි සංගණනය අනුව අලි ගහනයේ වර්ධනයක් සිදුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි මිනිස් ගැටුම් වාර්තා වන දිස්ත්‍රික්ක කවරේද;

(ii) අලි මිනිස් ගැටුම හේතුවෙන් 2025 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිදුවී ඇති වන අලි මරණ සංඛ්‍යාව සහ මරණයට පත්වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගල්ගමුව, ඇහැටුවැව, අඹන්පොල සහ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වන අලි හැසිරීම්වල සුවිශේෂ ලක්ෂණ හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එම ලක්ෂණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2036/2026

ගරු සුජීව දිසානායක මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හලාවත වැවිලි සමාගම විසින් පසුගිය වසර 20ක කාලය තුළ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ණය මුදල් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම රාජ්‍ය ආයතන කවරේද;

(iii) එම ණය මුදල් ලබාදී ඇති පදනම කවරේද;

(iv) එම ආයතන සඳහා ලබාදී තිබෙන ණය මුදල එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025.12.31 දින වනවිට එම ආයතනවලින් අය කරගෙන ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) හිඟ ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම හිඟ ණය මුදල් අය කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2041/2026

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරෝනා වසංගත සමයේ වැලිකන්ද මූලික රෝහලට සහ පොළොන්නරුව මහ රෝහලට පරිත්‍යාගශීලීන් විසින් වෛද්‍ය උපකරණ සහ අනෙකුත් උපකරණ පරිත්‍යාග ලෙස ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම පරිත්‍යාගශීලීන්ගේ නම් සහ ලිපින කවරේද;

(iii) එසේ ලබාදුන් උපකරණ පිළිබඳ ලේඛනයක් තිබේද;

(iv) එසේ නම්, එම උපකරණ සහ ඒවායේ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම උපකරණ රෝහල් ඉන්වෙන්ට්‍රියට (බඩු වට්ටෝරු පොත) ඇතුළත් කර තිබේද;

(vi) එසේ නම්, ඒවාට අදාළ ඉන්වෙන්ට්‍රි අංක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii)හි සඳහන් උපකරණ වෙනත් රෝහල් වෙත ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම රෝහල් සහ ලබා දුන් උපකරණ හා ඒවායේ ප්‍රමාණ කවරේද;

(iii) පරිත්‍යාග ලෙස ලැබුණු උපකරණ ප්‍රමාණය සහ මේ වනවිට පවතින උපකරණ ප්‍රමාණය අතර ඌනතාවයක් තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) ඉහත අ(i)හි සඳහන් රෝහල්වල එම කාලසීමාව තුළ සේවයේ යෙදී සිටි වෛද්‍ය අධ්‍යක්ෂකවරුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 සහ 2 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2026 ජනවාරි මස 06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව, 2026 සැප්තැම්බර් 17 දින දක්වා දීර්ඝ කළ යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති,— 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඇ) වගන්තිය සහ VI කොටස සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 ජූනි 09 දිනැති අංක 2492/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2026 මැයි 28 දිනැති අංක 2490/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*3.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මාලදිවයින් ජනරජයේ ආණ්ඩුව අතර 2025 ජූලි මස දී අත්සන් කරන ලද ගිවිසුම සම්බන්ධයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 05 දිනැති අංක 2470/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති,— 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 106 සහ 78(ආ) වගන්ති සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 මාර්තු 12 දිනැති අංක 2479/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.22 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*14.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

17.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---